**අධ්‍යක්ෂ සහ අතිරේක අධ්‍යක්ෂ තෝරා ගැනීම සඳහා ලකුණු ලබා දීමේ පටිපාටිය (මුළු ලකුණු 100)**

<table>
<tr><th>නිර්ණායක</th><th>නිර්ණායක හා සම්බන්ධ විස්තර</th></tr>
<tr><td>අ. සේවා පළපුරුද්ද<br>(උපරිම ලකුණු 70)</td><td>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ (I පන්තියේ) සක්‍රීය සේවා කාලය සඳහා ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි දෙවන ඡේදයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ (I පන්තියේ) සක්‍රීය සේවා කාලය සඳහා වෙන් කර ඇති ලකුණු ගණන අනුව තීරණය කරනු ලැබේ.<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 02/2014 හි විධිවිධාන හා ඒ සඳහා ආනුෂංගික චක්‍රලේඛ අනුව සක්‍රීය සේවා කාලය ගණනය කළ යුතුය.</td></tr>
<tr><td rowspan="2">ආ. කුසලතා<br><br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>(උපරිම ලකුණු 30 යි)</td><td>ආ. i කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය සඳහා දායකත්වය (උපරිම ලකුණු 15)<br><br>සම්මුඛ පරීක්ෂණ දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිතා කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br><br>(වසරකට ලකුණු 03 බැගින් වසර පහක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)<br><br>
<table>
<tr><th>කාර්ය සාධන ඇගයීමේ දී ලබාගත් ශ්‍රේණිගත කිරීම</th><th>වසරකට වෙන් කළ උපරිම ලකුණු</th></tr>
<tr><td>විශිෂ්ටයි</td><td>ලකුණු 3</td></tr>
<tr><td>සාමාන්‍යයට වඩා ඉහළින්</td><td>ලකුණු 2</td></tr>
<tr><td>සතුටුදායකයි</td><td>ලකුණු 1</td></tr>
</table></td></tr>
<tr><td>ආ. ii ප්‍රකාශන (උපරිම ලකුණු 8)<br>(ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)<br><br>(a) ප්‍රකාශිත තීරක සහරා / පොත් සහ පොත් පරිච්ඡේද / පුහුණු මොඩියුල / විෂයමාලා යනාදියෙහි කතෘත්වය<br>(එකක් සඳහා උපරිම ලකුණු 01 බැගින්)<br><br>(b) ප්‍රකාශිත සාරාංශ / පුහුණු ද්‍රව්‍ය / තීරක නොවන සහරා / ප්‍රවෘත්ති පත්‍ර සහ සහරා වල විද්‍යාත්මක ලිපි / අන්තර්ක්‍රියාකාරී සංයුක්ත තැටි / වෙබ් ප්‍රකාශන යනාදියෙහි කතෘත්වය<br>(එකක් සඳහා උපරිම ලකුණු 0.5 බැගින්)<br><br>ද්වි ගණනය නොවන පරිදි එක් අයිතමයක් (a) හෝ (b) යටතේ සලකා බලනු ලැබේ.</td></tr>
</table>

**ආ. iii සම්මාන හා ප්‍රශංසා (උපරිම ලකුණු 02)**
**(ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)**

- **ප්‍රශංසා (ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ පොදු 230 බී ආකෘතියේ ප්‍රශංසා සඳහා පමණි) (එකක් සඳහා උපරිම ලකුණු 01 බැගින්)**

- **සම්මාන: - පහත පරිදි සම්මාන සඳහා ලකුණු ප්‍රදානය කෙරේ**

| **සම්මාන මට්ටම** | **එක් සම්මානයක් සඳහා ප්‍රදානය කළ ලකුණු ගණන** |
|---|---|
| කෘෂිකාර්මික අංශයට දැක්වූ දායකත්වය වෙනුවෙන් ලබා ඇති ජාත්‍යන්තර සම්මාන | ලකුණු 2 |
| කෘෂිකාර්මික අංශයට දැක්වූ දායකත්වය වෙනුවෙන් ලබා ඇති ජාතික සම්මාන (උදා: ජනාධිපති සම්මාන, ASDA හොඳම කෘෂි විද්‍යාඥයාට හිමි සම්මානය / විද්‍යාඥ සම්මානය) | ලකුණු 1 |
| කෘෂිකාර්මික අංශයට දැක්වූ දායකත්වය වෙනුවෙන් ලබා ඇති ජාතික / පළාත් මට්ටමේ විශේෂ සම්මාන (උදා: ඉහත සඳහන් සම්මාන වලට අමතරව වෙනත් ASDA සම්මාන) | ලකුණු 0.5 |

**ආ. iv සම්මුඛ පරීක්ෂණයේදී දක්වන දක්ෂතා (උපරිම ලකුණු 05)**
**(තනතුර අදාල ක්ෂේත්‍රයට / ආයතනයට / මධ්‍යස්ථානයට අදාළව අපේක්ෂකයින්ගේ ඉදිරිපත් කිරීම සඳහා වන ඇගයීම)**

සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු විසින් පෙන්වන ලද සන්නිවේදන කුසලතා, ආකල්ප, විශ්ලේෂණ කුසලතා මත පදනම්ව පහත කරුණු සම්බන්ධයෙන් ලකුණු ප්‍රදානය කෙරේ

- වත්මන් තත්වය විශ්ලේෂණය කිරීම
- ගැටළු / අවශ්‍යතා හඳුනා ගැනීම සහ විසඳුම් යෝජනා
- හඳුනාගත් බාධක ජය ගැනීම සඳහා උපායමාර්ගික සැලසුම්

*ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කර ඇති මුල් පිටපත අනුව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ලකුණු ලබා දීමේ පටිපාටිය.*